(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 313.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2013 නොවැම්බර් මස 25 වැනි සඳුදා පූ. භා. 9.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2998/'12

1\.
ගරු රෝසි සේනානායක මහත්මිය,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) වර්ෂ 2009 සිට 2012 දක්වා කාල සීමාව තුළදී,

(i) එක් එක් දිස්ත්‍රික්කය අනුව සිදුවී ඇති ළමා අපචාර සහ අපයෝජන සිද්ධීන් සංඛ්‍යාව;

(ii) එම සිදුවීම්වල ස්වභාවය අනුව එක් එක් සිදුවීම් සංඛ්‍යාව;

(iii) අදාළ සිද්ධීන්ට ගොදුරු වූ ගැහැණු ළමුන් සහ පිරිමි ළමුන් සංඛ්‍යාව;

කොපමණද යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම සිද්ධිවලට ගොදුරු වූ ළමුන් අතරින් මව හෝ පියා විදේශගත වූ ළමුන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3081/'12

2\.
ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරි පනතට සංශෝධන ගෙන ඒමේ සූදානමක් තිබේද;

(ii) එසේ නම්, එම කටයුතු ප්‍රමාද කිරීමට හේතු කවරේද;

(iii) ඒ සඳහා ඇති බාධක ඉවත් කර සංශෝධන ගෙන ඒම සඳහා කටයුතු කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2012 වර්ෂය ඇතුළුව පසුගිය වර්ෂ අටක කාල සීමාව තුළ දුම්පානය කිරීම නිසා මිය ගිය සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) දුම්පානය නිසා පිළිකා හෝ වෙනත් රෝග හේතුවෙන් රෝගී වන පුද්ගලයෙකු සඳහා රජයට වැය කිරීමට සිදුවන මුදල කොපමණද;

(iii) දුම්බීම නිසා රෝගී වන පුද්ගලයන් සඳහා 2005 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාල සීමාව තුළ වෙන් කිරීමට සිදුවූ රෝහල් ඇඳන් සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) 2012 රාජ්‍ය අයවැය මගින් සෞඛ්‍ය සඳහා වෙන් කරනු ලැබූ මුදලින් දුම්පානය හේතුවෙන් පිළිකා හෝ වෙනත් රෝගවලට ගොදුරුවූ රෝගීන් වෙනුවෙන් වෙන් කරනු ලැබූ මුදලේ ප්‍රතිශතය කොපමණද;

(ii) එම මුදල පසුගිය වර්ෂයට සාපේක්ෂව වැඩිවී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3124/'12

3.

ගරු රවී කරුණානායක මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ත්‍රිකුණාමලය - අනුරාධපුරය මාර්ග සංවර්ධන ව්‍යාපෘතියට අදාළව,

(i) මාර්ගයේ දිග කොපමණද;

(ii) ප්‍රතිසංස්කරණය සඳහා ගන්නා ලද කාලය කොපමණද;

(iii) ඉදිකිරීම්කරු තෝරාගනු ලැබුවේ ටෙන්ඩර් පටිපාටියක් මගින්ද;

(iv) එසේ නම්, තෝරාගනු ලැබූ ලංසුකරුගේ නම කවරේද;

(v) මුදල් ලබාගන්නා ලද මූලාශ්‍ර කවරේද;

(vi) එක් කිලෝමීටරයකට ඉදිකිරීම් පිරිවැය කොපමණද;

(vii) කිසිවෙකුට හෝ වන්දි ප්‍රදානය කරනු ලැබ තිබේද;

(viii) එසේ නම්, වන්දි ප්‍රදානය කරනු ලැබ ඇති පුද්ගලයින්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3143/'12

4.

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) හතළිස් තුන් ලක්ෂයක් පමණ වන පාසල් සිසුන් අතරින් උසස් අධ්‍යාපනය සඳහා වරම් ලබන ප්‍රතිශතය කොපමණද;

(ii) ලෝකයේ වෙනත් රටවලට සාපේක්ෂව එම ප්‍රතිශතය අවම මට්ටමක පවතින බව පිළිගන්නේද;

(iii) අධ්‍යාපනය වෙනුවෙන් 2012 වර්ෂය හැර පසුගිය වර්ෂ විස්සක කාලය තුළ යෙදවූ මුදල ඒ ඒ වර්ෂවල දළ දේශීය ආදායමේ ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2012 වර්ෂය තුළ අධ්‍යාපනය වෙනුවෙන් රජය වෙන්කළ මුදල දළ දේශීය ආදායමේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පාසල් අධ්‍යාපනය වෙනුවෙන් දෙමාපියන්ගෙන් මුදල් එකතු කිරීම මේ වනවිට සාමාන්‍යයෙන් පවතින ක්‍රියාවලියක් බවත්;

(ii) එයට හේතුව රජය අධ්‍යාපනය සඳහා ප්‍රමාණවත් මුදලක් වෙන් නොකිරීම බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3196/'12

5\.

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) (i) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී සෞදි අරාබියේ ගෘහ සේවිකාවන් වශයෙන් සහ වෙනත් රැකියා සඳහා ගොස් ඇති ශ්‍රී ලාංකික කාන්තාවන් සහ පිරිමින් විශාල සංඛ්‍යාවක් ඉතා දුක් විඳිමින් දැනට එම රටේ "ඔලායා" රැඳවුම් කඳවුරේ සහ "ජෙඩා" පාලම යට රැඳී සිටින බවත්;

(ii) අදාළ ගිවිසුම් පරිදි සුදුසු රැකියා ස්ථාන නොලැබීම, හිංසනය සහ වැටුප් නොගෙවීම වැනි විවිධ කරුණු ඒ සඳහා හේතු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ශ්‍රී ලාංකික පිරිස වහාම මෙරටට ගෙන්වා ගැනීමට කටයුතු කරන්නේද;

(ii) ඔවුන්ගේ පවුල්වල ආරක්ෂාව, සුභසාධනය සහ ආර්ථිකය නංවාලීම සඳහා ක්ෂණිකව ක්‍රියාත්මක කළ හැකි, ප්‍රායෝගික වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3423/'13

6\.

ගරු පී. හැරිසන් මහතා,— වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ මේ දක්වා හඳුනාගෙන ඇති කුරුලු විශේෂ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් ශ්‍රී ලංකාවට ආවේනික කුරුලු විශේෂ සංඛ්‍යාව කොපමණද;

(iii) ශ්‍රී ලංකාවට ආවේනික කුරුලු වර්ග අතරින් වඳ වී ඇති හෝ වඳවීමේ තර්ජනයට ලක්වී ඇති කුරුලු විශේෂ සංඛ්‍යාව කොපමණද;

(iv) එම වඳවීමේ තර්ජනයට ලක්වී ඇති කුරුලු විශේෂ ආරක්ෂා කර ගැනීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3469/'13

7\.

ගරු තිස්ස අත්තනායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා ජනාධිපතිතුමා සහභාගී වූ විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංචාර සිදු කරන ලද රටවල නම් කවරේද;

(iii) එම එක් එක් සංචාරය සඳහා වැය වූ මුළු මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් සංචාරයේදී ජනාධිපතිතුමා සමග සංචාරයට එක් වූ පුද්ගලයන්ගේ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම එක් එක් සංචාරයේදී කරන ලද සාකච්ඡා සහ අත්සන් කරන ලද ගිවිසුම් කවරේද;

(vi) එම එක් එක් සංචාරය, සාකච්ඡාව හා ගිවිසුම මගින් රටට අත්වූ හෝ අත් වෙමින් ඇති හෝ අත් වෙතැයි අපේක්ෂිත ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3731/'13

8.

ගරු අනුර දිසානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පිළියන්දල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ අත්සනින් 2012.02.20 දින වෑවල, ආනන්ද සමරකෝන් විද්‍යාලේ විද්‍යාලපති වෙත යවන ලද ලිපියක් මගින්,

(i) එම විද්‍යාලේ 5 වසර සමත්වන දරුවන් මාම්පෙ ධර්මරාජ විද්‍යාලයට ඇතුළත් කිරීමට වහාම කටයුතු කරන ලෙසත්;

(ii) මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ වෑවල ආනන්ද සමරකෝන් විද්‍යාලයේ සංවර්ධනය වෙනුවෙන් විශාල මුදලක් රජය වැයකර ඇති බවත්;

දන්වා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) වෑවල ආනන්ද සමරකෝන් විද්‍යාලේ සංවර්ධනය සඳහා යොදවා ඇති මුදල කොපමණද;

(ii) එම මුදල් යොදවා ඇති කාර්යයන් කවරේද;

(iii) එම මුදල් කවුරුන් විසින්, කුමන වැඩසටහන යටතේ ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3751/'13

9.

ගරු සුජීව සේනසිංහ මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 පෙබරවාරි 23 දිනට පසු පිරිපහදුකර වෙළඳපළට නිකුත් කිරීමට ආනයනය කළ බොරතෙල් බැරලයක මිල ශ්‍රී ලංකා රුපියල්වලින් කොපමණද;

(ii) එම බොරතෙල් බැරලයක් පිරිපහදු කිරීමේ පිරිවැය කොපමණද;

(iii) පිරිපහදු කළ පෙට්‍රල්, ඩීසල් සහ භූමිතෙල් ලීටරයක් සඳහා බදු හා ලාභය එකතු කිරීමට ප්‍රථම දරන පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඩීසල් සහ භූමිතෙල් ලීටරයක මිලට එකතු කළ බදු මුදල හා ලාභය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2013 පෙබරවාරි 23 දින සිට අලෙවිය සඳහා ආනයනය කළ පිරිපහදු කරන ලද ඩීසල් හා භූමිතෙල් ලීටරයකට වැය වූ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2013 පෙබරවාරි 24 දින සිට පෙට්‍රල්, ඩීසල් සහ භූමිතෙල් ලීටරයක විකුණුම් මිල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත ඉන්ධන මිල ගණන් නියම කිරීමට හේතුවී ඇත්තේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කළමනාකරණ අකාර්යක්ෂමතා, නාස්තිය හා දූෂණ නිසා බව පිළිගන්නේද;

(ii) එවැනි තත්ත්වයන් නිවැරදි කර සාධාරණ මිලකට ඉන්ධන අලෙවි කිරීමට ක්‍රියා කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3082/'12

10.

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2005 සිට 2012 දක්වා කාල සීමාව තුළ,

(i) මද්‍යසාර භාවිතය නිසා රෝගීන් බවට පත්වූ සංඛ්‍යාව;

(ii) මද්‍යසාර භාවිතය නිසා රෝගීව මිය ගිය සංඛ්‍යාව;

(iii) මත්පැන් භාවිතය හේතුවෙන් සිදුවුණු රිය අනතුරු නිසා මිය ගිය සංඛ්‍යාව;

(iv) රජය මගින් සෞඛ්‍ය සඳහා වැය කරන මුදලින්, මත්පැන් භාවිතය නිසා රෝගී වන පුද්ගලයන් වෙනුවෙන් වැය කරන ලද මුදල;

වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3424/'13

11.

ගරු පී. හැරිසන් මහතා,— වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ මේ දක්වා හඳුනාගෙන ඇති සමනල විශේෂ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් ශ්‍රී ලංකාවට ආවේනික සමනල විශේෂ සංඛ්‍යාව කොපමණද;

(iii) ශ්‍රී ලංකාවට ආවේනික සමනලුන් අතරින් වඳ වී හෝ වඳවීමේ තර්ජනයට ලක්වී ඇති සමනල විශේෂ සංඛ්‍යාව කොපමණද;

(iv) එම වඳවීමේ තර්ජනයට ලක්වී ඇති සමනල විශේෂ ආරක්ෂා කර ගැනීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3637/'13

12.

ගරු රවී කරුණානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සපුගස්කන්ද තෙල් පිරිපහදුව උත්ශ්‍රේණිගත කිරීම සඳහා යෝජිත නවීකරණයට අදාළව,

(i) එහි වර්තමාන තත්ත්වය කවරේද;

(ii) භාවිතා කරනු ලබන තාක්ෂණය කවරේද;

(iii) එම කටයුතුවලට සම්බන්ධ වන රට කවරේද;

(iv) එකී නවීකරණය මෙතෙක් සිදුකර නොමැත්තේ මන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉරාන රජය වර්ෂ 2009 දී ලබාදීමට පොරොන්දු වූ ඇමරිකන් ඩොලර් බිලියන 1.5ක ණය මුදල සපුගස්කන්ද තෙල් පිරිපහදුව නවීකරණය කිරීම සඳහා යොදා නොගන්නේ මන්ද;

(ii) එකී ණය මුදල ආපසු ගෙවිය යුතු කාලසීමාව කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3735/'13

13.

ගරු අනුර දිසානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 වර්ෂය සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රධාන විධායක තනතුරට බඳවා ගැනීම පිණිස පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමට අදාළව පුවත්පත් දැන්වීමක් පළ කරනු ලැබුවේද;

(ii) එම තනතුර සඳහා බඳවා ගැනීමට අදාළව ඉල්ලුම්පත් කැඳවා තිබේද;

(iii) එසේ නම්, ඒ අනුව ඉල්ලුම් පත් ඉදිරිපත් කරනු ලැබූ අය කවුරුන්ද;

(iv) ඉහත සඳහන් කැඳවීම් අනුව, තෝරා ගන්නා ලද පුද්ගලයින් සේවයට බඳවා නොගැනීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වර්තමාන කළමනාකරණ අධ්‍යක්ෂවරයාගේ නම කවරේද;

(ii) ඔහුගේ සුදුසුකම් කවරේද;

(iii) ඔහු සේවයට බඳවා ගත් දිනය කවරේද;

(iv) ඔහුගේ වැටුප් තල කවරේද;

යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

විසර්ජන පනත් කෙටුම්පත (2014) — (තුන්වැනි වෙන් කළ දිනය) — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2013 නොවැම්බර් 21) [1]

*2.

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යොන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

9.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

10.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

11.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

12.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

13.

මෛත්‍රීපාල සේනානායක පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

14.

හැන්ඩ්ස් ෆෝ එඩියුකේෂන් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]
"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---